**ශ්‍රී ලංකා මේස පන්දු සංගමය - 2022**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය ව්‍යාචනය**

ශ්‍රී ලංකා මේස පන්දු සංගමයේ ("සංගමය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සහ 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 21(අ) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මම මතයක් ප්‍රකාශ නොකරමි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මෙම වාර්තාවේ 1.5 ඡේදයේ මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| බැංකු ශේෂය | 483,865 | බැංකු ප්‍රකාශන සහ බැංකු සැසඳුම් ප්‍රකාශ | සියලුම සාක්ෂි ඉදිරිපත් කරනු ඇත. | ශේෂයන් සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත අවශ්‍ය ලියකියවිලි ප්‍රමාණවත් ලෙස සැපයිය යුතුය. |
| ලැබිය යුතු දෑ සහ මුදල් අත්තිකාරම් | 396,821 | ශේෂය තහවුරු කිරීම | | |
| ගෙවිය යුතු දෑ | 1,146,680 | ශේෂය තහවුරු කිරීම | | |
| ආදායම | 3,927,010 | ලදුපත් | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබිය යුතු දෑ රු. 384,821 ක් සහ ගෙවිය යුතු දෑ රු. 452,820 ක් වසර 05 කට වැඩි කාලයක් නිරවුල් කිරීමකින් තොරව සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු නොකර පැවතුණි. | 2023 වර්ෂයේදී එය නිවැරදි කරනු ඇත | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් පියවීමට කඩිනම් පියවර ගත යුතුය |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණය ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදිය වෙත යොමු කිරීම | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1990/23 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් රෙගුලාසි වල III වන කොටසේ (xiii) වගන්තිය. | කමිටුව විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම මාස දෙකක් ඇතුළත විගණකාධිපතිතුමන් වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සංගමය විසින් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 08ක ප්‍රමාදයකින් පසුව 2023 නොවැම්බර් 17 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | 2023 වසරේදී මූල්‍ය ප්‍රකාශන ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | ක්‍රීඩා සංගම් රෙගුලාසි අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 3 (III) ඡේදය. 2021 දෙසැම්බර් 17 දිනැති DSD/NSA/COM-01/202 | ක්‍රීඩා සංගමය සඳහා පවත්වාගෙන යා හැක්කේ බැංකු ගිණුම් දෙකක් පමණි. බැංකු ගිණුම් දෙකකට වඩා පවත්වාගෙන යාමට අවශ්‍ය නම් ඒ පිළිබඳව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ. කෙසේ වෙතත්, සංගමය විසින් බැංකු ගිණුම් 05ක් පවත්වාගෙන ගොස් තිබූ අතර එම බැංකු ගිණුම් අතරින් 2022 වසරේ බැංකු ගිණුම් 02ක කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත. | නිවැරදි කිරීමේ පියවර ගෙන ඇත. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට අනුව බැංකු ගිණුම් පවත්වාගෙන යා යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 268,995 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 7,442 ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 276,437ක වර්ධනයක් නිරීක්ෂණය විය. පසුගිය වසරට සාපේක්ෂව සෘජු වියදම් කැපී පෙනෙන ලෙස අඩුවීම මෙම වර්ධනයකට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතාව

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට රු.889,000 ක් වටිනා ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. | එය 2023 දී නිවැරදි කරනු ඇත. | අවශ්‍ය ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය. |
| (ආ) වසර 05 කට වැඩි කාලයක් පවතින ආපසු ගෙවිය යුතු තැන්පතු ඇතුළුව රු.160,000 ක් වටිනා තැන්පතු ශේෂ 17 ක් පැවති අතර එම තැන්පතු පියවීමට කටයුතු නොකිරිම සඳහා හේතු විගණනය වෙත හෙළිදරව් කර නොතිබුණි. | එය 2023 දී නිවැරදි කරනු ඇත. | එම වටිනාකම් කඩිනමින් පියවිය යුතුය |